# ජාතික රාජ්‍ය සභාවේ

# 1975 අංක 16 දරන දෙව් සුව සේවාව (සංස්ථාගත කිරීම) පනත

[සහතිකය සටහන් කළේ 1975 මාර්තු මස 17 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1975 මාර්තු මස 27 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 16 දරන
දෙව් සුව සේවාව (සංස්ථාගත කිරීම) පනත

[සහතිකය සටහන් කළේ 1975 මාර්තු මස 17 වන දින]

එල්. ඩී.—ඕ. 36/74.

දෙව් සුව සේවාව යනුවෙන් සමිතියක් සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සුවපත් කිරීමේ සේවය කෙරෙහි විශේෂ අවධාරණයකින් යුතුව, උන්වහන්සේගේ ශුභ ආරංචිය දේශනා කිරීම උදෙසා තියඩෝර් හෙන්රි පෙරේරා දේවගැතිතුමා විසින් මොරටුවේ කඩලානෙහි දෙව් සුව සේවාව යන නමින් ධර්ම දූත මෙහෙයක් ආරම්භ කර ඇති හෙයින් ද : (පූර්විකාව.)

ඉහත කී සේවය පවත්වා ගෙන යාම සඳහා මහජනයා සිය කැමැත්තෙන් ම අරමුදල් ප්‍රදානය කර ඇති හෙයින් ද :

එකී තියඩෝර් හෙන්රි පෙරේරා දේවගැතිතුමා ස්වකීය භාර්යාව වන සිලීෂියා ජොයිස් පෙරේරා සමග හවුල්ව එකී අරමුදල්වලින් නිශ්චල දේපළක් මිලට ගෙන මේ සේවය පවත්වා ගෙන යාමේ කාර්යය සඳහා ඒ දේපළ සිය භාරයේ තබා ගෙන ඇති හෙයින් ද :

පසුව ව්‍යවස්ථා මාලාවක් සකස් කොට පිළිගෙන දෙව් සුව සේවාව යනුවෙන් හැඳින්වෙන සමිතියක් බවට පත් වූ පිරිසක් විසින් එකී සේවයේ කටයුතු සහ පරමාර්ථ පාලනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම මේ දක්වා කරගෙන යන ලද හෙයින් ද :

තවද දෙව් සුව සේවාව යනුවෙන් හැඳින්වෙන එකී සමිතිය සංස්ථාගත කරන ලෙස එම සමිතිය විසින් ඉල්ලා ඇති හෙයින් සහ ඒ ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 16 දරන දෙව් සුව සේවාව (සංස්ථාගත කිරීම) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. (ලුහුඬු නාමය.)

2. (මේ පනතෙහි මින් මතු "සමිතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) දෙව් සුව සේවාව යනුවෙන් හැඳින්වෙන සමිතියේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් මේ පනත ආරම්භ වන දිනයෙහි සිට සහ ඉන් පසුව (මේ පනතෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "දෙව් සුව සේවාව" යන නාමය යටතේ සදා සන්තතිය ඇති සංස්ථාවක් බවට පත් වී එසේ පැවතිය යුතු ය. තව ද ඒ නාමයෙන් එම තැනැත්තන් විසින් සියලුම අධිකරණයන්හි නඩු පවරනු ලැබිය හැකි ය. එසේම එම නාමයෙන් සියලුම අධිකරණයන්හි ඔවුන්ට විරුද්ධව නඩු පවරනු ලැබිය හැකි ය. (දෙව් සුව සේවාව සමිතිය සංස්ථාගත කිරීම.)

ඒ 08009—8,719 (74/07)

පොදු මුද්‍රාව.

3. පොදු මුද්‍රාවක් තබා ගැනීමට හා පාවිච්චි කිරීමට ද එය සංස්ථාවේ කැමැත්ත අනුව වෙනස් කිරීමට ද සංස්ථාවට සම්පූර්ණ බලය සහ අධිකාරය ඇත්තේ ය. කාරක සභාවේ සභාපති, ලේකම් සහ තවත් සාමාජිකයකු ඉදිරිපිට දී හැර කිසිම සාධන පත්‍රයකට සංස්ථාවේ මුද්‍රාව නොතැබිය යුතු අතර තමන් සිටි බවට සාක්ෂි වශයෙන් ඔවුන් විසින් සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. එසේ අත්සන් කිරීම යම් තැනැත්තකු සාක්ෂිකරුවකු ලෙස කරන අත්සන් කිරීමට බාහිරව විය යුතු ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

4. යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සුවපත් කිරීමේ සේවය කෙරෙහි විශේෂ අවධාරණයකින් යුතුව, උන්වහන්සේගේ ශුභ ආරංචිය දේශනා කිරීමත්, ඒ කාර්යය සඳහා වෙනත් කටයුතු අතර, පහත සඳහන් කටයුතු කිරීමත්, සංස්ථාවේ පොදු පරමාර්ථ වන්නේ ය :—

(අ) පහත සඳහන් කටයුතු, එනම්—

(i) ශාරීරික, මානසික සහ ආත්මික වශයෙන් රෝගාතුර තැනැත්තන් බලාකියා ගැනීම, ඔවුන්ට සහනය සැලසීම සහ ඔවුන් සුවපත් කිරීම ; සහ

(ii) මාදක ධූර්තයන් හා සුරාසොඬුන් එසේ ධූර්ථ වීමෙන් හා සුරාසොඬ වීමෙන් මුදවා ගැනීම

යන කටයුතු සඳහා පුණ්‍ය නිවාස පිහිටුවීම ; සහ

(ආ) මිනිසා යළිත් පරිපූර්ණත්වයට පත් කිරීම සඳහා ත්‍යාගශීලී අන්දමින් උපකාර වීම ද වේ.

දේපළ සතුව තබා ගැනීමට සංස්ථාවට ඇති බලය.

5. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, අන්තිම කැමති පත්‍රයෙන් දේපළ බැහැර කිරීමක් කාරණ කොට ගෙන හෝ වෙනත් ආකාරයකින් හෝ සංස්ථාව සතු වන්නා වූ යම් චංචල හෝ නිශ්චල දේපළක් භාරගෙන සතුව තබා ගැනීමට නීතියෙහි ලා සංස්ථාවට හැකි විය යුතු අතර ඒ සියලු දේපළ, ඒවා විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට සම්පූර්ණ බලය ඇතිව සංස්ථාවේ තත්කාලීන රීතිවලට යටත්ව මේ පනතේ කාර්යයන් සඳහා සංස්ථාව විසින් සංස්ථාව සතුව තබා ගත යුතු ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

6. බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වා ගෙන යාමේ සහ වැසීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සේවක මණ්ඩලය සේවයට ගැනීමේ, සේවයේ නියුක්ත කර ගැනීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ හෝ එම පරමාර්ථ අතුරින් යම් කිසිවක් හෝ වැඩිදියුණු කිරීම හෝ නංවාලීම සඳහා අවශ්‍ය වන හෝ යෝග්‍ය කවර ආකාරයේ වූ හෝ සියලු ක්‍රියා කිරීමේ ද සියලු කරුණු ඉටු කිරීමේ සහ සියලු දේ ක්‍රියාත්මක කිරීමේ ද බලය සංස්ථාවට තිබිය යුතු ය.